**බණ්ඩාරවෙල මහා නගර සභාව - 2023**

**-------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

බන්ඩාරවෙල මහා නගර සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් පිළිබඳ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන් වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන මහා නගර සභා ආඥා පනතේ (252 වන අධිකාරය) 219 වගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට බණ්ඩාරවෙල මහා නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාශර්වයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මහා නගර සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව මහා නගර සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාතර්‍ාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මහා නගර සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් 154(6) විගණකාධිපති වාර්තාවේ කර තිබුණු 1.6.1 (ආ) (උ) යන නිර්දේශ හැර අනෙකුත් නිර්දේශ ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන වල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේදී මහා නගර සභාවේ මහජන පුස්තකාලයට ඇති වූ හදිසි ජල ගැලීම් හේතුවෙන් සිදු වූ හානි ප්‍රතිපූර්ණය වෙනුවෙන් ලැබිය යුතු රක්ෂණ වන්දිය රු. 6,924,833 ක් මූල්‍ය ප්‍රකාශන තුළ ඇතුළත් කර නොතිබුණි. | 2024 වර්ෂයේ ගිණුම්වලින් ගැලපීමට කටයුතු කරන බව. | නිවැරදිව ගිණුම් පිළියෙල කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේදී මහජන පුස්තකාලයට පරිත්‍යාග ලෙස ලැබී තිබුණු රු.1,746,000 ක පුස්තකාල පොත් වටිනාකම ගිණුම්ගත කර නොතිබුණි. | -එම- | -එම- |
| (ඇ) | ඉකුත් වර්ෂයට අදාළ ස්ථාවර තැන්පත් පොලී ආදායම් රු. 916,164 ක් සමාලෝචිත වර්ෂයේ ආදායමක් ලෙස සලකා ගිණුම්ගතකර තිබුණි. | -එම- | -එම- |
| (ඈ) | ඉකුත් වර්ෂයට අදාළ රු.836,350ක් වූ තොග පොළ සහ සිල්ලර පොළ බදු දීමේ ටෙන්ඩර් ආදායම සමාලෝචිත වර්ෂයේ ආදායමක් සේ සලකා ගිණුම්ගතකර තිබුණි. | -එම- | -එම- |
| (ඉ) | ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනය පිළියෙල කිරීමේදී ගෙවිය යුතු දේශීය ණය සහ සංවර්ධන අරමුදල් ගිණුමෙන් මගහැරී තිබුණු ණය මුදල රු.4,403,970 ක් සමුච්චිත අරමුදලට හර කර තිබුණි. | වත්කම් හා වගකීම් සමානව පැවැතිය යුතු බැවින් මෙය සමුච්චිත අරමුදලට ගලපා ඇති බව. | ගිණුම් නිවැරදිව පිළියෙල කළ යුතුය. |
| (ඊ) | 2021 වර්ෂයේදී ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයට අන්තර්ග්‍රහණය කර තිබුණු නිලධාරීන් 14 කගෙන් අයකර ගත යුතු සේවක ණය රු.703,896 ක් මූල්‍ය ප්‍රකාශන තුළ ඇතුළත් කර නොතිබුණි. | එම ශේෂය සමාලෝචිත වර්ෂයේ සමුච්චිත අරමුදලට ගලපා ඇති බව. | සේවක ණයශේෂ අයකරගැනීමට ක්‍රියා කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (උ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මහා නගර සභාව විසින් අධිකරණයේ පවරා තිබුණු සිවිල් නඩු 09 ක් සහ බාහිර පාර්ශවයන් විසින් මහා නගර සභාවට එරෙහිව පවරා තිබුණු නඩු 09 ක් සම්බන්ධව මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. | 2024 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී හෙළිදරව් කිරීමට කටයුතු කරන බව. | ආයතනයේ අඛණ්ඩ පැවැත්මට වැදගත් වන තොරතුරු මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළ යුතුය. |

### 1.6.2 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිලිබඳ ප්‍රකාශනයේ දේපළ පිරියත හා උපකරණ ශේෂය රු.4,110,576,197 ක් වුවද එදිනට ප්‍රාග්ධන යෙදවුමට ආදායමින් දායකවීමේ ගිණුමේ ශේෂය රු.4,116,606,427 ක් වීමෙන් මෙම ශේෂ දෙක අතර රු.6,030,230 ක වෙනසක් පැවතුණි. | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය දේපළ පිරියත උපකරණ ශේෂය සහ එදිනට ප්‍රාග්ධන යෙදවුමට ආදායමින් දායක වීමේ ගිණුමේ ශේෂය නිවැරදි කිරීමට කටයුතු කරන බව. | නිවැරදිව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුය. |

### 1.6.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| එකතු වටිනාකම රු.1,642,517 ක් වූ වත්කම් වර්ග 3කට අදාළව ස්ථාවර වත්කම් ලේඛන හා බඩු වට්ටෝරු පොත් ඉදිරිපත් නොකිරීම හේතුවෙන් විගණනයේදී සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය. | අදාළ තොරතුරු ඉන්වෙන්ට්‍රිගතව තිබේද යන්න පරීක්ෂා කිරීමට නිලධාරින්ට උපදෙස් ලබාදී ඇති බව සහ භෞතිකව නොමැති දේපල හා පිරියත වේ නම් පළාත් පාලන දෙපාර්තමේන්තුවේ උපදෙස් හා නියෝග පරිදි ඉදිරියේදී කටයුතු කරන බව. | බඩු වට්ටෝරු පොත්, ස්ථාවර වත්කම් ලේඛන යාවත්කාලීනව පවත්වාගත යුතුය. |

## 1.7 අනුකූල නොවීම්

**නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

නීති , රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 1987 අංක 19 දරණ මහා නගර සභා අණ්ඩා පනත (252 අධිකාරය) | | | |
| | 272 (6) (වගන්තිය)<br>267 (30) වගන්තිය | මහා නගර සභා සීමාව තුළ ප්‍රසිද්ධ කර තිබුණු ප්‍රචාරක දැන්වීම් පුවරු 93 ක් වෙනුවෙන් බලපත්‍ර ගාස්තු රු.4,292,587 ක් අයකරගෙන නොතිබුණි. | රු.734,485 ක මුදලක් මේ වන විට අයකරගෙන ඇති බව. | කාලීනව ප්‍රචාරක දැන්වීම් ආදායම් අයකරගත යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය<br>මුදල් රෙගුලාසි 104 (4)වගන්තිය | 2015 අප්‍රේල් මාසයේ සිදුව තිබුණු අනතුරක් සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂණයක් සමාලෝචිත වර්ෂය අවසන් වනවිටත් සිදුකර නොතිබුණි. | 2019.07.12 දින පළාත් සභා සහ පාලන අමාත්‍යාංශයට ලිපි යොමු කර තිබුණද මෙතෙක් පිළිතුරු ලැබී නොමැති බව. | මුදල් රෙගුලාසි අනුව කටයුතු කල යුතුය |
| (ඇ) | 2002 පෙබරවාරි 25 දිනැති අංක01/2002 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ | වාහන 28 ක රාජ්‍ය ලාංඡනය හා ආයතනයෙහි නම වාහනයේ පින්තාරු කර නොතිබුණි. | බණ්ඩාරවෙල මහා නගර සභාව සතු වාහන සඳහා රාජ්‍ය ලාංඡනය මේ වන විට යොදා ඇති බව. | රාජ්‍ය ලාංඡනය සහ නම පින්තාරු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරනලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.54,749,311 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායමරු.15,807,000 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

නාගරික කොමසාරිස්වරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කල ආදායම්, රැස්කල ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2023 | | | | 2022 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 20,030,000 | 18,201,585 | 10,435,017 | 7,766,568 | 15,335,000 | 39,332,837 | 13,797,077 | 25,535,760 |
| (ii) | කුලී | 47,744,803 | 55,201,498 | 49,085,432 | 6,116,066 | 44,919,768 | 95,221,185 | 49,053,982 | 46,167,202 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 6,704,000 | 13,327,004 | 13,327,004 | - | 10,105,000 | 7,603,250 | 7,603,250 | |
| (iv) | වෙනත් ආදායම් | 33,890,000 | 45,432,268 | 45,432,268 | - | 52,000,000 | 56,805,259 | 46,546,563 | 10,257,696 |
| | එකතුව | **108,368,803** | **132,162,355** | **118,279,721** | **13,882,634** | **122,359,768** | **198,962,531** | **117,000,872** | **81,960,658** |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟ හිටි වරිපනම් බදු රු.7,252,568 ක් අයකරගෙන නොතිබුණි. | රු.1,805,216ක් අයකරගෙන ඇති බව. | හිඟහිටි වරිපනම් බදු අයකරගත යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟහිටි කඩ කුලී රු.5,773,458 ක් අයකරගෙන නොතිබුණි. | ඉදිරියේදී අයකර ගැනීමට කටයුතු කරන බව. | හිඟහිටි කඩ කුලී අයකරගත යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟ දේපළ බදු රු.3,599,354 ක් අයකරගෙන නොතිබුණි. | -එම- | හිග හිටි දේපළ බදු අයකරගත යුතුය. |
| (ඈ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අදාළව හිඟහිටි තානායම් කළමනාකරණ ගාස්තු රු.17,353,588 ක් අයකරගෙන නොතිබුණි. | -එම- | හිඟ හිටි ආදායම් අය කරගත යුතුය. |
| (ඉ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු උසාවි දඩ රු.1,226,378 ක් සහ මුද්දර ගාස්තු රු.16,975,243ක් ගෙන්වාගෙන නොතිබුණි. | හිඟ උසාවි දඩවල සඳහන් අදාල මුදල් ගෙන්වා ගැනීම සඳහා පළාත් පාලන කොමසාරිස්තුමා වෙත සහ පළාත් ආදායම් කොමසාරිස් වෙත ලිපි යවා ඇති බව. | හිඟ ශේෂ අයකරගත යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 පනතින් පවරා ඇති කාර්යයන් ඉටු කිරීම

මහා නගර සභා ආඥා පනතේ 4 වන වගන්තිය යටතේ වූ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| විධිමත්ව කසළ ප්‍රතිචක්‍රීයකරණ වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කිරීමකින් තොරව නොදිරන කසළ ටොන් 45 ක් පමණ බණ්ඩාරවෙල මඩුගස්තැන්න යන ස්ථානයේ ගොඩ ගසා තිබුණි., | නොදිරන කසළ බදුල්ල මහා නගර සභාව වෙත යොමු කිරීමට කටයුතු කර ඇති බව . | විධිමත්ව කසළ කළමනාකරණයක් සිදු කළ යුතුය. |

### 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මහා නගර සභාව විසින් නුග සෙවණ වෙළඳ සංකීර්ණයේ කඩ කාමර 105 ක් බදු දීමේදී ටෙන්ඩර් ක්‍රියාවලිය අනුගමනය කර නොතිබුණි. | නුග සෙවණ වෙළඳ සංකීර්ණය ඉදි කිරීමට පෙර ව්‍යාපාර කටයුතුවල නිරත වූ කඩහිමියන් හට සභා අනුමැතිය ප්‍රකාරව කඩ කාමර දීර්ඝ කාලීනව බදු දී ඇති බව. | දේපළ බදු දීමේදී ටෙන්ඩර් කර වැඩිම වාසියක් ලැබෙන ආකාරයට ක්‍රියා කළ යුතුය. |

### 3.3 වත්කම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| බණ්ඩාරවෙල මහා නගර සභාව විසින් භාවිත කරනු ලබන ගලි බවුසරය, ගිනි නිවන රථය සහ කැබ් රථයක අයිතිය සභාවට පවරාගෙන නොතිබුණි | අයිතිය පවරා ගැනීම සඳහා ලිපි මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව වෙත භාර දී ඇති බව. | සභාව සතු දේපළ වල අයිතිය නීත්‍යානුකූලව පවරා ගත යුතුය. |

### 3.4 අවිධිමත් ගණුදෙනු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2021 දෙසැම්බර් 29 දිනැති 13/2008 (vi) අංක දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අනුව බණ්ඩාරවෙල මහා නගර සභාවේ විධායක නිලධාරියෙකු විසින් එකම වාහනයට මාසිකව ඉන්ධන ලීටර් 140 ක දීමනාවක් හා මහා නගර සභා අරමුදලින් රු.172,320 ක ඉන්ධන ලීටර් 455 ක්2022 අප්‍රේල් සිට 2023 මාර්තු මාස වලට අදාළව ලබාගෙන තිබුණි. | ඉන්ධන ප්‍රමාණයන් සහ ලබා ගත් කාරණාවන් පරීක්ෂා කර බලා ඉන්ධන ප්‍රමාණයන් වැඩිපුර ලබාගෙන ඇත්නම් එම ප්‍රමාණය කොටස් වශයෙන් මාසික ඉන්ධන දීමනාව ලබා ගැනීමේදී හිලව් කිරීමට කටයුතු සිදු කරනු ලබන බව. | වැඩිපුර ගෙවීම් කඩිනමින් අය කර ගත යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේදී මහා නගර සභාවේ කාර් රථයකට සභාවේ ඉන්ධන සංචිතයෙන් ඔක්ටේන් 92 වර්ගයේ ඉන්ධන පාවිච්චි කර තිබුණු අතර, නිලධාරියාට ගෙවීම් කිරීමේදී ඔක්ටේන් 95 වර්ගයේ ඉන්ධන මිල පදනම් කරගෙන ගෙවීම් කිරීම හේතුවෙන් සභා අරමුදලින් රු.175,000 ක් වැඩිපුර ගෙවා තිබුණි. | ඉන්ධන සංචිතයක් ඇති කර ඒ මගින් ආයතනයේ කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යාමට පියවර ගන්නා ලද බව. | වැඩිපුර ගෙවීම් කඩිනමින් අය කරගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | සීවලී පාර සාප්පු සංකීර්ණයේ කඩ කාමර 228 ක් දීර්ඝකාලීනව බදුදීමට මහා නගර සභාවේ නාගරික ඉංජිනේරුවරයාගේ සහ තවත් සාමාජිකයින් 04කගෙන් සමන්විත කමිටුවක් මඟින් අවම ලංසු වටිනාකම තීරණය කර කඩ කාමර බදු දී තිබුණි. | සීවලී සාප්පු සංකීර්ණයේ කඩ කාමර 228 සඳහා රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව මගින් මේ වන විට තක්සේරුවක් සිදු කර ඇති බව. | කාලීනව දේපල තක්සේරු කර බදු දීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේදී මහා නගර සභාව විසින් සීවලී පාර සාප්පු සංකීර්ණයේ කඩ කාමර 228 ක් දීර්ඝකාලීනව බදුදීමට 2022 මැයි 31 දිනැතිව ප්‍රසිද්ධ පුවත්පත් තුනක දැන්වීම් පළ කර තිබුණි. දැන්වීම් වල කඩ කාමර වටිනාකම් තක්සේරු මුදලටත් වඩා අඩු මුදලක් අවම ලංසු මුදල ලෙස ඇතුළත් කර තිබීම හේතුවෙන් පළමු පුවත්පත් දැන්වීම සංශෝධනය කිරීම ඇතුළු අවස්ථා දෙකකදී පුවත්පත්වල දැන්වීම් පළ කිරීම වෙනුවෙන් සභා අරමුදලින් රු.84,424 ක් ගෙවා තිබුණි. | රාජකාරී ඉටු කිරීමේදී සිදු වූ ප්‍රමාද දෝෂයක් නිසා පුවත්පත් දැන්වීම නැවත නිවැරදි කර පල කරන ලද බව. | වගකිව යුතු නිලධාරීන්ගෙන් අයකරගත යුතුය. |
| (ඉ) | සභාවට අයත් තොග හා සිල්ලර පොළෙහි 2020 වර්ෂයට ගාස්තු අයකිරීමේ අයිතිය බදුදීම සඳහා 2019 වර්ෂයේ පුවත්පත් දැන්වීම් පලකර තිබුණි. ලංසු කැඳවීම දින 06කට සීමා කර තිබීම දැන්වීම් පළකර දින 03කට පසු ලංසු පෝරම නිකුත් කිරීම වැනි කාරණා මඟින් ලංසුකරුවන් සපුරාලිය යුතු බවට නියම කරන ලද විශේෂ කොන්දේසි සපුරා ගැනීමට ප්‍රමාණවත් කාලයක් නොතිබීම වැනි ඉතාම සුළු අඩුපාඩුවක් මත ඉහළම ලංසු ඉදිරිපත් කළ ලංසුකරුගේ ලංසු ප්‍රතික්ෂේප කිරීම හා අඩුම ලංසුව ඉදිරිපත් කළ ලංසුකරුගේ ලංසු පිළිගැනීම හේතුවෙන් රු.8,290,000 ක මූල්‍යමය පාඩුවක් නගර සභා අරමුදලට සිදුවී තිබුණි. | තොග හා සිල්ලර පොළ දීර්ඝ කාලයක් එකම පුද්ගලයකු බදු ගැනීම වැළැක්වීම සඳහා කොන්දේසි දැඩිකර පුවත්පත් දැන්වීම් පළ කර ටෙන්ඩර්කරුවකු තෝරාගෙන මහා නගර සභා ආඥා පනතේ 229 (2) වගන්තිය අනුව ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය ලබා ගෙන ඇති බව. | සභාවට ඉහළම වාසියක් වන ආකාරයට ටෙන්ඩර් ක්‍රියාවලිය අනුගමනය කළ යුතුය. |